කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 02 WWL /19/11/29/02
වර්ණය : ඇම්බර්

# තද වැසි පිළිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2019 නොවැම්බර් මස 30 වන දින ප.ව. 02.30 වන තෙක් වලංගු වන පරිදි
2019 නොවැම්බර් මස 29 වන දින ප.ව. 02.30 ට නිකුත් කරන ලදී.

## ගොඩබිම් ප්‍රදේශ සඳහා

දිවයින පුරා පවතින වැසි තත්ත්වයේ තරමක වැඩි වීමක් හෙට දිනයේ (නොවැම්බර් 30) සිට බලාපොරොත්තු වේ.

උතුරු, වයඹ, සබරගමුව, බස්නාහිර සහ මධ්‍යම පළාත්වල සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් ඇතැම් ස්ථානවලට මි.මී.100-150 පමණ තද වර්ෂාපතනයන්ද, සෙසු පළාත්වල (විශේෂයෙන්ම දකුණු, ඌව සහ උතුරු මැද පළාත්වලත් මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල) ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ක පමණ තරමක් තද වර්ෂාපතනයන්ද ඇති විය හැක.

මධ්‍යම කඳුකර ප්‍රදේශවලත් උතුරු, උතුරු-මැද සහ වයඹ පළාත්වල සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් සුළගේ වේගයේ විටින් විට පැ.කි.මී. 40 දක්වා වැඩි විය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

